**තනතුරු පුරප්පාඩු**

**කෘෂිකර්ම,පශු සම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ.

**01. අතිරේක අධ්‍යක්ෂ (HM 2-1) - පුරප්පාඩු 01**

**අධ්‍යාපන සුදුසුකම්**

බාහිර : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාව (Science), කෘෂි විද්‍යාව (Agriculture), සමාජ විද්‍යාව (Sociology), වාණිජ්‍යය (Commerce), ව්‍යාපාර පරිපාලනය(Business Administration) පිළිබඳව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක විෂයධාරාවකින් උපාධියක් ලබා තිබීම.

සහ

විද්‍යාව (Science), කෘෂි විද්‍යාව (Agriculture), සමාජ විද්‍යාව (Sociology), වාණිජ්‍යය (Commerce), ව්‍යාපාර පරිපාලනය(Business Administration) පිළිබඳව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක විෂය ධාරාවකින් පශ්චාත් උපාධියක් (Postgraduate Degree) ලබා තිබීම හෝ පිළිගත් වෘත්තීය ආයතනයක වෘත්තිය සාමාජිකත්වය ලබා තිබීම

සහ

පළමු උපාධියෙන් පසුව සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක කළමනාකරණ මට්ටමේ වසර 20 ක පළපුරුද්දක් ලබා තිබිම සහ ඒ අතරින් වසර 05ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වීම.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක විද්‍යාව (Science), කෘෂි විද්‍යාව (Agriculture), සමාජ විද්‍යාව (Sociology), වාණිජ්‍යය (Commerce), ව්‍යාපාර පරිපාලනය(Business Administration) පිළිබඳව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක විෂයධාරාවකින් උපාධියක් ලබා තිබීම.

සහ

විද්‍යාව (Science), කෘෂි විද්‍යාව(Agriculture), සමාජ විද්‍යාව (Sociology), වාණිජ්‍යය (Commerce), ව්‍යාපාර පරිපාලනය(Business Administration) පිළිබඳව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක අදාළ විෂයධාරාවකින් දර්ශනපති උපාධියක්(Ph.D) ලබා තිබීම.

සහ

පළමු උපාධියෙන් පසුව සංස්ථාවක, මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ වසර 05 ක පළපුරුද්දක් ලබා තිබිම.

**අභ්‍යන්තර :** අදාල තනතුර හා සම්බන්ධ සේවය ජ්‍යෙෂ්ඨ කළමනාකාර තනතුරක යටත් පිරිසෙයින් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සහ

විෂයාන්තර කණ්ඩායම්වලට (Multi-Disciplinary teams) නායකත්වය දීම පිළිබඳව කුසලතාවයක් පෙන්වා තිබීම. මානව හා අනෙකුත් සම්පත් මැනවින් කළමනාකරණය කිරීම පිළිබඳව අත්දැකීම් තිබීම.

**වයස :** වයස අවුරුදු 35ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් කේතය සහ වැටුප් පරිමාණය :**

HM 2-1 [රු. 161,140- 12x4,850- 219,340]

**02. පර්යේෂණ නිලධාරී (AR 1): - පුරප්පාඩු සංඛ්‍යාව 08**

**<u>සුදුසුකම් සහ පළපුරුද්ද</u>**

**<u>බාහිර අයදුම්කරුවන්</u>**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව (Sociology), ආර්ථික විද්‍යාව (Economics), ආර්ථික මිතිකය (Econometrics), සංඛ්‍යානය (Statistics) කෘෂි විද්‍යාව (Agriculture), පෝෂණය (Nutrition), රාජ්‍ය ප්‍රතිපත්ති (Public Policy), ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන (Gender Studies), සන්නිවේදනය (Communication) පිළිබඳව හෝ අදාළ ක්ෂේත්‍රයන් හි විෂය සංයුතියකින් යුත් සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් හදාරා ප්‍රථම පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් ලබා තිබීම.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව (Sociology), ආර්ථික විද්‍යාව (Economics), ආර්ථික මිතිකය (Econometrics), සංඛ්‍යානය (Statistics) කෘෂි විද්‍යාව (Agriculture), පෝෂණය (Nutrition), රාජ්‍ය ප්‍රතිපත්ති (Public Policy), ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන (Gender Studies), සන්නිවේදනය (Communication) පිළිබඳව හෝ අදාළ ක්ෂේත්‍රයන් හි විෂය සංයුතියකින් යුත් සිව් අවුරුදු විශේෂ උපාධි පාඨමාලාවක් හදාරා දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහ අදාළ ක්ෂේත්‍රයේ එක් වසරකවත් පර්යේෂණ සහිත පශ්චාත් උපාධියක් ලබා තිබීම.

හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සමාජ විද්‍යාව (Sociology), ආර්ථික විද්‍යාව (Economics), ආර්ථික මිතිකය (Econometrics), සංඛ්‍යානය (Statistics) කෘෂි විද්‍යාව (Agriculture), පෝෂණය (Nutrition), රාජ්‍ය ප්‍රතිපත්ති (Public Policy), ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අධ්‍යයන (Gender Studies), සන්නිවේදනය (Communication) පිළිබඳව හෝ අදාළ ක්ෂේත්‍රයන් හි විෂය සංයුතියකින් යුත් උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ දෙවසරක පර්යේෂණ සහිත පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**<u>වයස</u>**

අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**<u>වැටුප් කේතය හා වැටුප් පරිමාණය</u>**

AR 1: රු . [91,650-2,480x10-3,450x15-168,200]

**03.** සංඛ්‍යාන නිලධාරී (JM 1-2) - **පුරප්පාඩු 11**

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද**

<u>බාහිර</u> :

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක සංඛ්‍යානය පිළිබඳ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක අදාල ක්ෂේත්‍රයේ උපාධියක් සහ උපාධිය ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වාණිජ ආයතනයක අවම වශයෙන් වසරක (01) අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

සහ

අ.පො.ස.(සා/පෙ) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

<u>අභ්‍යන්තර</u> :

තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයෙහි 'සංඛ්‍යාන සහකාර (I ශ්‍රේණිය)' තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සැ.යු. - පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ හැකියාව අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

<u>වයස</u> :

අවුරුදු 22කට නොඅඩු විය යුතු අතර අවුරුදු 45කට නොවැඩි විය යුතුය.

අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදාළ නොවේ.

<u>වැටුප් සංකේතය හා වැටුප් තලය</u> :

JM 1-2:- රු. [74,010-1,360 x 10-2,040 x18-124,330/-]

**04.** සංඛ්‍යාන සහකාර (උපාධිධාරි) **(**MA – 3**)- පුරප්පාඩු 07**

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :**

බාහිර :

සංඛ්‍යානය, ගණිතය, ආර්ථික විද්‍යාව යන විෂයයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් ලබා තිබීම. උපාධිය සඳහා සංඛ්‍යානය විෂයය හදාරා නැති අපේක්ෂකයින් අ.පො.ස (සා.පෙළ) සඳහා ගණිතයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතුය. පරිගණක හැකියාව අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

වයස :

අවුරුදු 18 කට නොඅඩු විය යුතු අතර අවුරුදු 45කට නොවැඩි විය යුතුය.

වැටුප් සංකේතය හා වැටුප් තලය :

MA - 3 : රු. [ 53,940-800x10 -1,190x11 -1,320x10 -1,350x5 -94,980/-]

**05. පරිගණක තාක්ෂණ සහකාර - පුරප්පාඩු 01**

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :**

**අධ්‍යාපනික සුදුසුකම් :**

(අ) i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස (සා.පෙ) විභාගයෙන් එක් වතාවකදි විෂයන් හයකින් සමත් වී තිබීම.

(ආ) අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී "සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර අවශ්‍ය විෂයයන් සංඛ්‍යාවෙන් සාමාර්ථය ලැබ තෘතීය අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීමට අවශ්‍ය කාර්ය සාධන මට්ටම අත් කර ගෙන තිබීම.

**වෘත්තීය සුදුසුකම් :**

පිළිගත් ආයතනකින් ලබා ගත් පරිගණක මෘදුකාංග / දෘඪාංග පිළිබඳ එක් අවුරුදු ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම හෝ ඊට සමාන සුදුසුකම් ලබා තිබීම. (N.V.Q. 05 ට නො අඩු)

**සහ**

අදාල ක්ෂේත්‍ර යේ වසරක (01) පලපුරුද්දක් ලබා තිබීම.

**වයස** : අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් සංකේතය හා වැටුප් පරිමාණය**

MA 2-2:- රු. [50,540 – 10x540 – 7x630 – 4x1,080 – 20x1,280 –90,270]

## 06. කළමණාකරණ සහකාර (තාක්ෂණ නොවන) (MA 1-2) - පුරප්පාඩු 03

**අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද (පොදු)**

**බාහිර අයදුම්කරුවන් :-**

**අධ්‍යාපන සුදුසුකම් :**

(අ) i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii. ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. සා.පෙ)විභාගයෙන් එක් වතාවකදි විෂයන් හයකින් සමත් වී තිබීම.

(ආ) අ.පො.ස. (උ.පෙ.) විභාගයේදී "සාමාන්‍ය පොදු පරීක්ෂණය" හැර විෂයයන් තුනකින් සමත්ව තිබීම.

**විශේෂ කුසලතා**

පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ හැකියාව

සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි යතුරුලියනය

**අභ්‍යන්තර අයදුම්කරුවන් :-**

පහත සඳහන් සුදුසුකම් තිබෙන ප්‍රාථමික මට්ටමේ කාණ්ඩයට අයත් පුහුණු ප්‍රාථමික මට්ටමේ, අර්ධ පුහුණු සහ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු සේවකයන්ට අයදුම් කළ හැකිය.

**අධ්‍යාපන සුදුසුකම් :**

(අ) i. සිංහල / දෙමළ

ii. ඉංග්‍රීසි භාෂාව

iii.ගණිතය ඇතුළුව විෂයයන් හතරකට (04) සම්මාන සාමාර්ථ සහිතව අ.පො.ස. (සා.පෙ) විභාගයෙන් එක් වතාවකදි විෂයන් හයකින් සමත් වී තිබීම.

**වෙනත් සුදුසුකම් :**

ඉහත දැක්වෙන සේවා කාණ්ඩයේ ස්ථිර තනතුරක වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**විශේෂ කුසලතා**

පරිගණක මෘදුකාංග අදාල කර ගැනීම පිළිබඳ හැකියාව සිංහල / දෙමළ සහ ඉංග්‍රීසි යතුරුලියනය

**වයස :**

අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**වැටුප් සංකේතය හා වැටුප් පරිමාණය :**

MA 1-2 [රු.46, 220-540x10-630x7-1,080x12-1,280x12-84,350/-]

**සටහන :-** ස්ථිර තනතුරකට පත් කිරීමට පෙර යම් සේවා කාලයක් වේ නම් එය හෝ යම් තනතුරකට ස්ථිර පදනම මත පත් කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් පුහුණුව යටතේ සම්පූර්ණ කළ යුතු යම් සේවා කාලයක් වේ නම් එයද ඉහත සඳහන් කර ඇති පරිදි සුදුසුකම් සපුරාලීම සඳහා අවශ්‍ය පස් අවුරුදු සේවා කාලයට ගණන් නොගත යුතුය. එමෙන්ම අනියම් / තාවකාලික පදනම මත වූ සේවා කාලයන්ද මෙම කාර්යය සඳහා ගණන් නොගත යුතුය.

සටහන

පර්යේෂණ නිලධාරි සහ සංඛ්‍යාන සහකාර තනතුරු සඳහා කෙටි ලයිස්තුගත කල පසු තෝරා ගනු ලබන අයදුම්කරුවන් සඳහා ලිඛිත පරීක්ෂණයකට සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එහි ප්‍රතිඵල මත බඳවා ගැනීම සිදු කෙරේ. සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ මාධ්‍යයෙන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය හැකිය.

පර්යේෂණ නිලධාරි තනතුරට අයදුම්කරන අයදුම්කරුවන් (පැය 03 ක) යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර අවම වශයෙන් 50% ලකුණු ප්‍රමාණයක් එම පරීක්ෂණයෙන් සමත්වීම සඳහා ලබාගත යුතුය.

සංඛ්‍යාන සහකාර තනතුරට අයදුම්කරන අයදුම්කරුවන් විසින් පහත සඳහන් විෂයයන් සඳහා ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය.

| විෂය | ලකුණු | කාලය |
|---|---|---|
| 01. භාෂා ප්‍රවීණතාවය | 100 | පැය 1 ½ |
| 02. යෝග්‍යතා පරීක්ෂණය | 100 | පැය 1 ½ |
| 03. විෂයානුබද්ධ දැනුම | 100 | පැය 1 ½ |

**<u>වෙනත් ප්‍රතිලාභ :</u>**

අයදුම්කරුවන් තම වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) දායකත්වය දැරිය යුතු අතර, ආයතනය විසින් ඒ සඳහා වැටුපෙන් 15% ක් සේවක අර්ථසාධක අරමුදලට(EPF) සහ 3% ක් සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලට (ETF) දායකත්වයක් දරනු ඇත.

**ඉහත සඳහන් වැටුප් වලට අමතරව රජය විසින් අනුමත ජීවන වියදම් දීමනාව සහ අදාල අනෙකුත් දීමනා ගෙවනු ලැබේ.**

ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය ප්‍රතිලාභ හිමිකම් යෝජනා ක්‍රමයක්ද ක්‍රියාත්මක කෙරේ.

අධ්‍යාපන සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කරන සහතික වල පිටපත් ද ඥාති සම්බන්ධයක් නැති විස්තර සැපයිය හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ද සහිත සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **අධ්‍යක්ෂ, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය, 114, විජේරාම මාවත,කොළඹ 07** යන ලිපිනයට **2025.12.29** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි **තැපෑලෙන් එවිය යුතුය.** අයදුම් කරන තනතුර ලියුම් කවරයෙහි ඉහළ වම් කෙළවරෙහි පැහැදිලිව සඳහන් කළ යුතුය. ඉල්ලුම්පත්‍ර කාර්යාල වේලාවන් තුළදී ආයතනයේ ලේඛකාධිකාරී කාර්යාලයෙන් ලබා ගත හැකිය. එසේ නැතහොත් ආයතනයේ වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය. සියලු විස්තර **www.harti.gov.lk** වෙබ් අඩවියෙහි අන්තර්ගතය.

රජයේ ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා හෝ දෙපාර්තමේන්තුවල ඉල්ලුම්කරුවන් සිය ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය.

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරි**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**
**114, විජේරාම මාවත,**
**කොළඹ 07.**
**011 - 2696981**